# කාර්ය පත්‍රිකාව

**1.** පන්තිය : 8 ශ්‍රේණිය  විෂය : විද්‍යාව  අදාල සතිය : 04 සතිය දෙසැම්බර්

**2.** ඒකකය : 15 **ස්වාභාවික ආපදා**

## 3. ශිෂ්‍යයා කළ යුතු කාර්යයන්:

I. විද්‍යාව පෙළ පොතේ 15 පාඩම හොඳින් කියවා තේරුම් ගන්න.

II. මේ දින වල ඔබ ප්‍රදේශයට අකුණු සහිත කාලගුණ තත්වයක් උදා වී ඇත.ඔබ ප්‍රදේශයේ ආපදා කළමනාකරණ අංශයේ නිලධාරියා ඔබ නම් ඔබගේ ප්‍රදේශය අකුණු අනතුරු වලින් ආරක්ෂා කර ගැනීමට ඔබ ගන්නා පියවර ලැයිස්තු ගත කරන්න.

III. ස්වාභාවික ආපදා ඇතුළත් පුවත් පත් ශීර්ෂ පාඨ එකතු කරන්න

IV. මෑතකදී ශ්‍රී ලංකාවට ඇති වූ ස්වාභාවික ආපදා පිලිබඳ තොරතුරු රැස් කරන්න.

**4.** ඉහත ක්‍රියාකාරකම් සඳහා උපකාර කර ගත හැකි පොත් පත්, **websites, LMS** පාඩම් හා වෙනත් ඉගෙනුම් ආධාරක **(online, offline, printed)** :

I. **e -නැණපියස:**

- https://www.enenapiyasa.lk/lms/mod/page/view.php?id=18370
- https://www.enenapiyasa.lk/lms/mod/page/view.php?id=25702
- https://www.enenapiyasa.lk/lms/course/view.php?id=69

II. **E-තක්සලාව :**

- https://www.ethaksalawa.moe.gov.lk/moodle/course/view.php?id=123&lang=si

## 5. මෙම සතිය තුල නියමිත පාඩම් වලින් ලබා ගත යුතු ඉගෙනුම් ඵල :

I. ස්වාභාවික ආපදා වලින් සිදුවන හානි අවම කිරීමේදී සන්නිවේදනයේ වැදගත්කම අගය කරයි.

II. ස්වාභාවික ආපදා වලින් සිදුවන හානි අවම කිරීම සඳහා ගන්නා පූර්වෝපාය වල වැදගත්කම පිළිගනී.

III. තමන් සිටින ප්‍රෙද්ශයට ඇති විය හැකි ස්වාභාවික විපත් පිළිබඳ අවධානය යොමු කරයි.

**6. ඇගයීම් / තක්සේරුකරණ ක්‍රමවේදය** :

1.ශ්‍රී ලංකාවට බලපාන ස්වාභාවික ආපදා පිළිබඳ තොරතුරු ඇතුලත් වන සේ වාර්තාවක් සකස් කරන්න.

2.ශ්‍රී ලංකාවේ බලශක්ති උත්පාදනය කෙරෙහි නියගය අහිතකර ලෙස බලපාන්නේ කෙසේද?

3.ස්වාභාවික ආපදා වල තීව්‍රතාවය වැඩි කිරීමට මිනිස් ක්‍රියාකාරකම් හේතු වේ.මෙය පැහැදිලි කරන්න.

4.ගංවතුරකට සූදානම් වීමේදී ඔබ විසින් සකසා ගනු ලබන ආපදා මල්ලක අඩංගු විය යුතු දෑ මොනවාද?

5.අනාගතයේදී ස්වාභාවික ආපදා අවම කර ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග පිළිබඳ රචනාවක් ලියන්න.

.

.